සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ව්‍යාපාර අධ්‍යයනය - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

උපදෙස්:-

- ප්‍රශ්න අංක 01 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරේ අංකය තෝරා තිත් ඉරි මත ලියන්න.
- අංක 26 සිට 35 තෙක් වූ ප්‍රශ්නවලට අදාළ කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 05 බැගින් හිමි වේ.

---

(01) ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කළ අවශ්‍යතා ධූරාවලියේ කාණ්ඩ පහත දැක්වේ.

A - ආරක්ෂක අවශ්‍යතා
B - ආත්ම පරිපූර්ණ අවශ්‍යතා
C - කායික අවශ්‍යතා
D - මමත්ව අවශ්‍යතා
E - සාමාජීය අවශ්‍යතා

ඉහත අවශ්‍යතා කාණ්ඩ අනුපිළිවෙලට දැක්වූ විට නිවැරදි කාණ්ඩය වන්නේ,

(1) ABCDE (2) BACED (3) CAEDB (4) CBADE (5) BACDE (......)

(02) ඉපැරණි සමාජයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා බොහොමයක් තමා විසින්ම නිෂ්පාදනය කර සපුරා ගත් බව සඳහන් වුවද වර්තමානයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා බොහොමයක්ම වෙළඳ පොලින් භාණ්ඩ හා සේවා මිලට ගැනීමෙන් සපුරා ගනු ලබයි. එසේ වෙළඳපොලින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට හැකි වී ඇත්තේ,

(1) ප්‍රාථමික නිෂ්පාදනය නිසාය. (2) ඍජු නිෂ්පාදනය නිසාය.
(3) ඇණවුමට නිෂ්පාදනය නිසාය. (4) වක්‍ර නිෂ්පාදනය නිසාය.
(5) භාණ්ඩ හුවමාරුව නිසාය. (......)

(03) ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2014 වර්ෂයේ ලංකාවේ මුළු පාරිභෝගික සංඛ්‍යාව නිවැරදිව දැක්වෙනුයේ (දහස්වලින්)

(1) 20,039 කි. (2) 20,217 කි. (3) 20,450 කි. (4) 20,653 කි. (5) 20,869 කි. (......)

(04) 2014 මහබැංකුව වාර්තාව අනුව දළ දේශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් සපයන සේවාව වන්නේ,

(1) ආනයන වෙළඳාම (2) ප්‍රවාහනය (3) සන්නිවේදනය
(4) බැංකු (5) දේශීය වෙළඳාම (......)

(05) කලන්සූරිය මහතා සිංගප්පූරුවට ගොස් පරිඝනක හා ඒ ආශ්‍රිත උපාංග තොග වශයෙන් මිලදී ගෙන ඒවා නැව් මගින් මෙරටට ගෙන්වා රට පුරා ඇති පරිගණක අලෙවි සැල් වෙත බෙදා හරියි. ඔහු මුදල් රැස් කිරීමේ හා ගෙවීමේ කටයුතු සිය බැංකු හරහා සිදුකරයි. මෙම සමස්ථ ක්‍රියාවලිය හැඳින්විය හැක්කේ,

(1) වාණිජ්‍යය ලෙසය. (2) කර්මාන්ත ලෙසය.
(3) වෙළඳාම ලෙසය. (4) ආනයන ලෙසය.
(5) ද්විතීයික නිෂ්පාදන ලෙසය. (......)

(06) පහත සඳහන් වන්නේ වෙළඳ පොලේ බහුලව දැකිය හැකි නිෂ්පාදිත වර්ග කිහිපයකි.

A - සති අග පුවත්පත්
B - පුද්ගල පරිඝනක
C - ක්ෂණික යෝගට් පානය
D - සබන්
E - මෝටර් රථ
F - ශබ්ද කෝෂ
G - අත් ඔරලෝසු
H - පාවහන්

ඉහත සඳහන් නිෂ්පාදිත පහසු / සාප්පු / විශේෂිත / නොසෙවූ ලෙස වර්ග කළ විට නිවැරදි අනුපිළිවෙලින් දැක්වෙනුයේ,

(1) ACD / GH / BE / F
(2) ACD / H / BE / GF
(3) ACD / H / BEF / G
(4) CD / GH / ABE / F
(5) CDH / G / ABE / F (......)

(07) පාරිභෝගික හා කාර්මික නිෂ්පාදිත වල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - කෙටි ජීවිත කාලයක් පැවතීම.
B - ගැණුම් කරුවන් සාපේක්ෂව සීමිත වීම.
C - ව්‍යුත්පන්න ඉල්ලුමක් පැවතීම.
D - ඉල්ලුම්කරණ වාර ගණන සාපේක්ෂව වැඩිවීම.
E - වෙනත් භාණ්ඩ නිපදවීමට යොදා ගැනීම.

මේවායින් කාර්මික නිෂ්පාදිතවල ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) BAD ය. (2) ADE ය. (3) ACD ය. (4) BCE ය. (5) ADE ය. (......)

(08) සාර්ව පරිසරයේ ප්‍රධාන සංරචකයක් වන ප්‍රජා පරිසරයට පමණක් අයත් වන සාධක ලෙස සලකන්නේ,

(1) ජීවන ශෛලිය, අධ්‍යාපනය, උද්ධමනය, අමුද්‍රව්‍ය පරිභෝජනය, ජනවර්ගය.
(2) රැකියා මට්ටම, ජනගහනය, වයස් ව්‍යුහය, ස්ත්‍රී පුරුෂ බව, දළ ජාතික නිෂ්පාදිතය.
(3) ජනගහනය, වයස් ව්‍යුහය, ස්ත්‍රී පුරුෂ බව, අධ්‍යාපන මට්ටම, ජනවර්ගය.
(4) ස්ත්‍රී පුරුෂ බව, ජනවර්ගය, දළ ජාතික නිෂ්පාදිතය, වායු දූෂණ මට්ටම, පොලී අනුපාතය.
(5) ජනගහනය, ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ බව, රැකියා මට්ටම, දළ ජාතික නිෂ්පාදිතය. (......)

(09) පහත වගුවේ ඇල්මැති පාර්ශවයන් කිහිපයක් හා ව්‍යාපාරවල සමාජ වගකීම් කිහිපයක් දක්වා ඇත.

| ඇල්ම ඇති පාර්ශව | සමාජ වගකීම් |
|---|---|
| 1. කොටස්කරුවන් | A - රැකියා සහ අවම බාධා |
| 2. සැපයුම්කරුවන් | B - සාධාරණ මිල හා ආරක්ෂිත නිෂ්පාදිත |
| 3. පාරිභෝගිකයන් | C - අඛණ්ඩ ගනුදෙනු හා නියමිත වේලාවට ගෙවීම |
| 4. ප්‍රාදේශීය ජනතාව | D - නිසිකලට බදු |
| 5. රජය | E - ආයෝජනයට ප්‍රතිලාභ |

ඇල්මැති පාර්ශවයන් සහ ඔවුනට ඉටුවිය යුතු සමාජ වගකීම නිවැරදිව ගළපන ලද පිළිතුර කුමක් ද?

(1) 1A, 2B, 3C, 4D, 5E
(2) 1A, 3C, 2B, 4D, 5E
(3) 1E, 2C, 3B, 4A, 5D
(4) 1E, 2B, 3C, 4A, 5D
(5) 5A, 2B, 3C, 4D, 5E (......)

(10) ව්‍යාපාරයක් සමාජ වගකීම් සඳහා කැපවෙන බව පෙන්නුම් කිරීම සඳහා ආයතනයකට ලබාගත හැකි ප්‍රධානතම ප්‍රමිති අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) SLS / GMP / ISO 9001
(2) ISO 22000 / HACCP / GMP
(3) SA 8000 / ISO 14001 / OHSAS 18001
(4) SLS / ISO 9000 / ISO 27001
(5) SLS / ISO 14000 / ISO 27001 (......)

(11) ව්‍යාපාරයක ආචාරධර්ම සංග්‍රහයක් සකස් කිරීමේදී සැලකිල්ල යොමු කළ යුතු ප්‍රධාන සාධක නිවැරදිව දැක්වෙන කාණ්ඩය වනුයේ,

(1) ගනුදෙනුකරු / තරගකරුවන් / කළමනාකරුවන් / සම්පත් / වෙනස්කළ හැකි බව
(2) කළමනාකරුවන් / තරගකරුවන් / කාලීන ප්‍රවණතා / ප්‍රායෝගික බව / නම්‍යශීලී බව
(3) අයිතිකරුවන් / සේවකයන් / සංවිධානක්‍රමය / තාක්‍ෂණය / පරිමාව
(4) ගනුදෙනුකරු / සංවිධාන සංස්කෘතිය / සේවකයන් / ප්‍රායෝගික බව / සමාජ සංස්කෘතිය
(5) පිරිවැය / ප්‍රතිලාභ / සේවකයන් / තොරතුරු / කළමනාකරණය (......)

(12) නිෂ්පාදිතය යන්න වඩාත්ම හොඳින් පැහැදිලි කෙරෙන ප්‍රකාශය වන්නේ,

A - පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වෙළඳපොළට ඉදිරිපත් කරන ඕනෑම දෙයක්.
B - පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කිරීමට ඉදිරිපත් කරන ප්‍රතිලාභ කට්ටලයක්.
C - අවශ්‍යතාවයකට ඇති විසඳුම.
D - වටිනාකම් ප්‍රස්තුතය.

(1) A, B, C පමණි.
(2) A පමණි.
(3) A හා E පමණි.
(4) A, B, D පමණි.
(5) ඉහත සියල්ලමය. (......)

(13) ව්‍යාපාර අපේක්ෂක යනුවෙන් අදහස් කරන්නේ,

(1) ව්‍යාපාරය අනාගතයේදී ළඟාකර ගැනීමට අපේක්ෂා කරන ව්‍යාපාරික තත්ත්වය.
(2) ව්‍යාපාරය පවතින්නේ ඇයි හා ළඟාකර ගැනීමෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න.
(3) ව්‍යාපාරයක් ළඟාකර ගැනීමට උත්සහ කරන සමස්ථ අරමුණු හා කෙටිකාලීන අරමුණු වල එකතුවයි.
(4) දැක්ම, මෙහෙවර ප්‍රකාශය, ඉලක්ක හා පරමාර්ථ වල එකතුව.
(5) ව්‍යාපාර වල වාර්ෂික සැලසුමයි. (......)

(14) වර්තමානයේ ව්‍යාපාර ලෝකයේ පවතින තරගකාරීත්වය නිසා තම අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා සමාජ වගකීම් ඉටු කිරීමට ව්‍යාපාර යුහුසුළු වේ.

පහත සේවා අතරින් ව්‍යාපාරයකට සමාජ වගකීම් ඉටුකළ හැකි ආකාරයක් වන්නේ,

(1) මනා සේවක සම්බන්ධතාවක් පවත්වා ගැනීම.
(2) ආර්ථික ප්‍රතිලාභ රඳවා ගැනීම.
(3) කඩින් කඩ බදු ගෙවීම.
(4) රැකියා වියුක්තියට සක්‍රීයව දායක වීම.
(5) අපද්‍රව්‍ය බැහැර කරලීම. (......)

The National e-learning Portal for The General Education

(15) ''ව්‍යාපාර ආචාරධර්ම'' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(1) රජයේ නීතිරීති වලට ගරු කිරීමය.

(2) ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් අතර පවත්නා සදාචාරාත්මක යුතුකම් හා වගකීම් ය.

(3) සමාජ සුභසාධන ව්‍යාපාරවල නිරතවීමය.

(4) රජයේ නීතිරීති වලට අනුකූලව ව්‍යාපාරයකින් තම සේවකයන්ට වැටුප් හා වෙනත් දීමනා ගෙවීමය.

(5) ගනුදෙනුකරුවන් විසින් පිළිපැදිය යුතු නීති සමුදායකි. (......)

(16) ව්‍යාපාරයකින් ඉටුවිය යුතු සමාජ වගකීම් කිහිපයක් පහත දැක්වේ.

A - ආරක්ෂිත නිෂ්පාදිත

B - විනිවිදභාවය

C - සෞඛ්‍ය පහසුකම්

D - සමානාත්මතාවය

E - ප්‍රජා සත්කාරය

F - අපද්‍රව්‍ය කළමනාකරණය

G - වෘත්තීමය ආරක්ෂාව

H - රැකියා නියුක්තියට දායක වීම

I - කාර්යක්ෂම කළමනාකරණය

මේවා අතුරින් සේවක පාර්ශවයට පමණක් ඉටුවිය යුතු සමාජ වගකීම් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) ADF (2) BEH (3) CFG (4) ADI (5) CDG (......)

(17) පහත දැක්වෙන්නේ රජයක අරමුණු කිහිපයක් හා එම අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර දායක වන ආකාර කිහිපයක් වේ.

A - පූර්ණ සේවා නියුක්තිය

B - ආර්ථික ස්ථායිතාව

C - සාධාරණ ආදායම් ව්‍යාප්තිය

D - බදු ගෙවීම

E - සේවා නියුක්තියට දායක වීම

F - පරිසරහානි අවම කිරීම

G - ආර්ථික නිදහස

ඉහත දෑ අතරින් රජයක අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර දායක වන ආකාරය ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) ABC (2) BCD (3) CDE (4) DEF (5) FEG (......)

(18) පහත දැක්වෙන්නේ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බදු වර්ග කිහිපයකි,

A - එකතු කළ අගය මත බදු VAT

B - රේගු බදු

C - දේශීය භාණ්ඩ බදු

D - මන්දිර බදු

E - සමාගම් බදු

F - ආදායම් බදු

ඉහත බදු ඍජු බදු හා වක්‍ර බදු ලෙස පිළිවෙලින් වර්ග කළ විට ලැබෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) ABC / DEF (2) ABC / CEF (3) DEF / ABC

(4) ADE / DEF (5) CDF / ADC (......)

(19) මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජය වර්තමානයේ භාවිතා කරන උපකරණ කිහිපයක් පහත දැක්වේ.

A - ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය

B - සෙස් බදු පහළ දැමීම

C - අධ්‍යාපන වියදම් ඉහළ දැමීම

D - ප්‍රති ගැනුම් පොලී අනුපාතිකය

E - රාජ්‍ය ප්‍රතිපත්ති හා ණය ආධාර

F - ශිෂ්‍ය ප්‍රයෝග

G - විවිධ වෙළඳ පොළ කටයුතු

H - ණයවර ලිපි කාසි ආන්තික පැනවීම

I - ශීර්ෂ පිළිබඳ සීමා

මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා උපකරණ පිළිවෙලින් දැක්වෙන කාණ්ඩය වනුයේ,

(1) ADEFGHI / BCE (2) BCE / ADFGHI

(3) ABCD / EFGHI (4) BCDE / AFGHI

(5) BDA / CEFGHI (......)

(20) පහත දැක්වෙන්නේ එක්තරා ආහාර නිෂ්පාදන ආයතනයක් දක්වා ඇති ප්‍රකාශනයකි. ''ලෝක සාගිනි නිවාරණය කිරීම'' මෙය මෙම ආයතනයේ,

(1) දැක්ම විය හැකිය. (2) මෙහෙවර විය හැකිය.

(3) ඉලක්ක විය හැකිය. (4) පරමාර්ථය විය හැකිය.

(5) ප්‍රතිපත්තිය විය හැකිය. (......)

(21) ව්‍යාපාර වර්ගීකරණයට අදාළ පදනම් කිහිපයක් සහ ඊට අදාළ කරගතහැකි ව්‍යාපාර සඳහා නිදසුන් කිහිපයක් පහත වගුවේ දක්වා ඇත.

| ව්‍යාපාර වර්ග කිරීමේ පදනම | ව්‍යාපාර සඳහා නිදසුන් |
|---|---|
| 1. නිෂ්පාදන අංශ (සේවා) | A - මිහිරි රස ආහාර වෙළඳ සැල |
| 2. හිමිකාරත්වය (රාජ්‍ය) | B - මෙත් සෙවන ළමා නිවාසය |
| 3. අරමුණු (ලාභ රහිත) | C - නැවුම් පලා වර්ග නිවසට සපයන්නෝ |
| 4. නිෂ්පාදන ස්වභාවය (ද්විතියික) | D - විභාග දෙපාර්තමේන්තුව |
| 5. පරිමානය (සුළු) | E - නිර්මාණී ගොඩනැගිලි ඉදිකරන්නෝ |

(1) 1-A/2-B/3-D/4-C/5-E
(2) 1-B/2-A/3-D/4-C/5-E
(3) 1-D/2-C/3-A/4-E/5-B
(4) 1-E/2-A/3-C/4-D/5-D
(5) 1-C/2-E/3-A/4-D/5-B (......)

(22) ලොව පුරා ලාභ අරමුණු සහිතව හා රහිතව ක්‍රියාත්මක වන ව්‍යාපාර මිලියන ගණනක් දැකිය හැකිය. මෙවෙනි ඕනෑම ව්‍යාපාරයක් පැවතීමට පදනම සපයන්නේ,

(1) ඉල්ලුම හා සැපයුම
(2) වෙළඳ පොළය
(3) සාර්ථක නිෂ්පාදිතයන් ය
(4) අවශ්‍යතා හා වුවමනාය
(5) පුද්ගල ක්‍රය ශක්තියයි (......)

(23) ව්‍යාපාරයක් ලාභ ලැබීමේ අර්ථය වනුයේ,

(1) පාරිභෝගික ජනතාව අපහසුතාවට පත්කිරීමකි.
(2) ව්‍යාපාර සමාජ වගකීම් සංකල්පය අත්හැර දැමීමකි.
(3) ව්‍යාපාර සමාජ වගකීම් ආරම්භ කිරීම සඳහා වූ සුභ ලකුණකි.
(4) ව්‍යාපාර ආචාරධර්මවලට පිටුපෑමකි.
(5) ව්‍යාපාර ඒකාධිකාරී තත්වයට පත්වීමකි. (......)

(24) පහත සඳහන් අවස්ථා අතුරෙන් වෙළඳ පොළක් තැනීමේ අවස්ථාවක් ලෙස සැලකිය නොහැක්කේ කුමක් ද?

(1) මුහුදු මසුන්ගෙන් ටින් මාළු නිපදවා ගබඩා කිරීම.
(2) සිල්ලර කඩයකින් මිරිස් කිලෝ දෙකක් මිලදී ගැනීම.
(3) නාට්‍යයක් නැරඹීම සඳහා ටිකට් පතක් මිලට ගැනීම.
(4) අන්තර්ජාලය ඔස්සේ රක්ෂණාවරණයක් ලබාගැනීම.
(5) දානමය කටයුත්තකට පිරිතර මිලදී ගැනීම. (......)

(25) ව්‍යාපාර කටයුතු පාලනය සඳහා රජය මැදිහත් වීම අවශ්‍යව ඇත්තේ,

(1) රජයට ආදායම් ලබා ගැනීමටය.
(2) දළ ජාතික නිෂ්පාදිතය වැඩිකර ගැනීමටය.
(3) මහජන සුභ සිද්ධිය සඳහාය.
(4) ව්‍යාපාර අතර තරඟය ඇතිකිරීම සඳහාය.
(5) රාජ්‍ය අංශයේ ව්‍යාපාර ආරක්ෂා කර ගැනීමටය. (......)


- **ප්‍රශ්න අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

(26) (අ) භෞතික වශයෙන් පැවති වෙළඳ පොල තොරතුරු තාක්ෂණය නිසා ...................................... බවට පරිවර්තනය වෙමින් පවතී.

(ආ) ව්‍යාපාර ආයතනයක් සතු බුද්ධිමය එකතුව ........................................... ලෙස හැඳින්විය හැකිය.

(27) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී (1)........................................... (2)....................................... (3)........................................... (4)........................................... යනාදී කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

(28) ''ව්‍යාපාර'' සම්ප්‍රදායිකව වර්ග කෙරෙන ආකාරය දැක්වෙන පහත සඳහන් සටහනේ හිස් කොටු අට නිවැරදි පද භාවිතා කරමින් සම්පූර්ණ කරන්න.




(29) ව්‍යාපාර කටයුතු කිරීමේදී ව්‍යාපාරිකයා විසින් හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීමට සකස් කරන ලේඛනය ............................................ වන අතර ව්‍යාපාර කටයුතු කිරීමේදී ව්‍යාපාරිකයා විසින් මුළු මහත් සමාජයේම වෙසෙන සෑම පාර්ශවයකටම සාධාරණයක් වන අයුරින් කටයුතු කිරීම ............................................ ලෙස හඳුන්වයි.

(30) (අ) ව්‍යාපාරයක් දිගු අනාගතයේ දී තිබිය යුතු තත්ව පිළිබඳව ප්‍රවර්ථකයන්ගේ මනසේ මැවෙන පැහැදිලි චිත්‍රය ............................................ නම් වේ.


(ආ) ව්‍යාපාර දිගුකාලීන ළඟාකර ගැනීමට අපේක්ෂිත තත්වය සහ සංවිධානයේ විෂය පථය පිළිබඳ අවබෝධයක් ........................................... මඟින් සැපයේ.

(31) (අ) ශ්‍රී ලංකාව තුළ වරිපනම් බද්ද අයකරනු ලබන්නේ ........................................ විසින් වන අතර එය ............................................ මත අය කෙරේ.

(ආ) බදු ආදායම් .......................................... යටතේ ද, වර්තන වියදම් ........................................ යටතේ ද වර්ගකළ හැකිය.

(32) මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වාණිජ බැංකු ඉදිරියේ දී ගත යුතු මග කුමක් දැයි යන්න පිළිබඳව ඔවුන් දැනුවත් කොට ඒ සඳහා යොමු කිරීමට මහ බැංකුව විසින් කරනු ලබන දිරිගැන්වීම් ........................................... ලෙස හැඳින්වේ.

(33) රාජ්‍ය අයභාරය සම්බන්ධ පහත රූප සටහන සම්පූර්ණ කරන්න.




(34) වාණිජ බැංකු හා ප්‍රාථමික වෙළඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහබැංකුවේ ඇති රජයේ සුරැකුම්පත් ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතිකය .......................................... ලෙස හඳුන්වයි.

(35) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වර්තමානයේ ප්‍රකාශිත, පුද්ගලයකුගේ වාර්ෂික ආදායම් බදු නිදහස් කාල සීමාව කොපමණ ද?

..........................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ව්‍යාපාර අධ්‍යයනය - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

උපදෙස් :-

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

(01) (i) (අ) ''වෙළඳාම'', ''වාණිජ්‍යය'', ''විද්‍යුත් වාණිජ්‍යය'' සහ ''විද්‍යුත් ව්‍යාපාර'' යන මූලික සංකල්ප අර්ථ දක්වන්න.

(ආ) සඳමාල් කළමනාකරණ උපාධිය හදාරණ අවසාන වසරේ විශ්ව විද්‍යාල සිසුවෙකි. ඔහු තම දේශනවලට සහභාගීවීමෙන් පසු බස් රථයෙන් කිලෝමීටර 02 ක් පමණ දුරින් පිහිටි ස්ථානයක ඉංග්‍රීසි උපකාරක පංතියකට සහභාගී වේ. එය අවසන් වී නැවත ගෙදර යන්නේ පා ගමනින් වන අතර එසේ යන අතරේ දී තම පියා විසින් ගෙදරදී නිපදවන ලද හඳුන්කූරු පැකට් කඩවලට ලබාදීම සිදු කරයි. තම ව්‍යාපාර වැඩි දියුණු කරගැනීම සඳහා සඳමාල්ගේ පියා මෑතකදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් ද ලබාගෙන ඇත. තම පියා මීට අමතරව ගෙවතු වගාවක් ද කරගෙන යනු ලැබේ. එයින් තම නිවසේ පරිභෝජනයට අවශ්‍ය එළවළු පළතුරු වර්ග සපයා ගැනේ.

මෙම සිද්ධියෙන් විස්තර වන කුමන කරුණු මඟින් පහත සංකල්ප පිළිබිඹු වේදැයි දක්වන්න.

(a) භාණ්ඩ

(b) සේවා

(c) ඍජු නිෂ්පාදන

(d) වක්‍ර නිෂ්පාදන

(e) උපකාරක සේවා (ල. 24)

(ii) (අ) ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර පරිසරය ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. ඒ ඇසුරින් අභ්‍යන්තර හා ආසන්න පරිසරයට අයත් ප්‍රධාන බලවේග නම් කරන්න.

(ආ) ''ව්‍යාපාර පරිචයේ දී සමාජ වගකීම් හා ආචාරධර්ම යන පද එකම අර්ථයක් සහිත සංකල්ප ලෙස සැලකේ.'' මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ල.04)

(iii) ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික පරිසරයට අයත් ප්‍රධාන සාධක හයක් නම් කර පැහැදිලි කරන්න. (ල.04)

(iv) ආයතනයේ අගනාකම් (Value) හා විශ්වාස (Believe) මත ගොඩ ගොඩනැගෙන ව්‍යාපාර අපේක්ෂාවන් ප්‍රවර්ථකයන් ස්ථාපිත කරයි. එසේ ස්ථාපිත කරනු ලබන ප්‍රධානතම ව්‍යාපාර අපේක්ෂා 05 අනුපිළිවෙළට දක්වා ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ල.04)

(v) ''ව්‍යාපාර සංවර්ධනය වසර දෙකකින් ඇති වූවක් නොව එය මිනිස් ශිෂ්ටාචාරයට සමගාමීව සංවර්ධනය වූ ක්‍රියාදාමයකි.'' ව්‍යාපාර විකාශනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න. (ල.04)

(02) (i) (අ) ''අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාර විවිධ කාර්යයන් හි නියැලේ.'' එවැනි කාර්යයන් හයක් නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර පරමාර්ථ හයක් නම් කරන්න. (ල.04)

(ii) ''පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලීම මත ව්‍යාපාර පදනම් ව පවතී.'' මෙම ප්‍රකාශයේ අර්ථය පැහැදිලි කරන්න. (ල.04)

(iii) හුවමාරුව (Exchange) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? හුවමාරුවක් සිදුවීම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු කොන්දේසි කවරේද? (ල.04)

(iv) 'වෙළඳපොළ'' (Market) වර්ගීකරණය කළ හැකි පදනම් තුනක් නම් කර පැහැදිලි කරන්න. (ල.04)

(v) (අ) ස්පෘශ්‍යතාව අනුව නිෂ්පාදිත වර්ග කරනුයේ භාණ්ඩ හා සේවා ලෙසය. මේ එකිනෙකා අතර දැකිය හැකි වෙනස්කම් සඳහන් කරන්න.

(ආ) නිෂ්පාදිතයක් (Product) යනු කුමක්දැයි හඳුන්වා අත්‍යවශයෙන්ම එහි ඇතුළත් විය යුතු ගුණාංග මොනවාදැයි දක්වන්න. (ල.04)

(03) (i) රටක සංවර්ධනය සඳහා රජයට දායක විය හැකි ක්‍රම තුනක් නම් කර, ඒවා ව්‍යාපාර සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) පරිසරයට සුරැකීම සඳහා ඔබට දායක විය හැකි ආකාර හයක් නම් කරන්න.

(iii) ඔබගේ විද්‍යාලය කෙරෙහි ඇල්ම ඇති පාර්ශව හයක් නම් කර, ඒ ඒ පාර්ශව විද්‍යාලය කෙරෙහි ඇල්ම දැක්වීමට හේතු සඳහන් කරන්න.

(iv) ආයතනයක ගනුදෙනුකරුවන්, සේවකයින්, ආයෝජකයින් හා පොදු පරිසරය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සමාජ වගකීම් සංකල්පය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(v) ''ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට ඉහළම දායකත්වයක් සපයනු ලබන්නේ තෘතීයික කර්මාන්ත අංශයෙනි.'' තෘතීයික කර්මාන්තවල ඉහළ ආර්ථික ක්‍රියාකාරිත්වයක් කෙරෙහි කවර හේතු බලපා තිබේ ද?

(04) (i) ''ව්‍යාපාර ආචාරධර්ම (Business Ethics) විවිධ ව්‍යාපාර ශ්‍රිත (Business Functions) යටතේ සාකච්ඡා කෙරේ.'' එවැනි ශ්‍රිත හතරක් නම් කර ඒ යටතේ ගොඩනංවන ආචාර ධර්මතා දෙක බැගින් සඳහන් කරන්න.

(ii) (අ) ව්‍යාපාරය වලට අදාළ නීතිරීති හා රෙගුලාසි වලට යටත්ව ව්‍යාපාර කටයුතු කිරීමට අතිරේකව ව්‍යාපාර ඉටුකළ යුතු ආචාර ධර්මතා දෙකක් නම් කර ඒවා ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

(ආ) බාහිර ලෝකයේ නිතර අසන්නට දකින්නට ලැබෙන ආචාරධර්ම වලට පටහැනි සිද්ධීන් හතරක් නම් කරන්න.

(iii) (අ) ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල අයිතිය සුරක්ෂිත කෙරෙන පනත කුමක් ද? ඒ සම්බන්ධව කටයුතු කරන ආයතනය නම් කරන්න.

(ආ) ''පේටන්ට් බලපත්‍රය'' Patent / ස්වාධිකාර හිමිකම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? එවැන්නක ඇති වැදගත්කම කවරේ ද?

(iv) ව්‍යාපාරයක සාර්ව පරිසර බලවේග වන ප්‍රජා පරිසරය හා ආර්ථික පරිසරයට සම්බන්ධවන අවස්ථා හා තර්ජන දෙක බැගින් ලියන්න.

(v) (අ) යෝගට් නිෂ්පාදන ක්‍රියාවලිය යෙදවුම් නිමැවුම් ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් දක්වන්න.

(ආ) සෑම ආර්ථිකයක්ම විසින් ඉටුකරගැනීමට උත්සහ කරනු ලබන අරමුණු 04 ක් ලියන්න.

(05) (i) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති යටතේ (MONETARY POLICY) ආර්ථිකයේ මුදල් සැපයුම වෙනස් කිරීම සඳහා භාවිතා කරන මූලික උපකරණ නම් කර එයින් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ආ) ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන රජයේ පිස්කල් ප්‍රතිපත්තිය (FISCAL POLICY) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ii) (අ) බද්දක් යනු කුමක්දැයි හඳුන්වා, රජයක් විසින් බදු අයකර ගැනීමේ අපේක්ෂාවන් දක්වන්න.

(ආ) a. එකතු කළ අගය මත බද්ද (VAT) යන්න පැහැදිලි කර එය අය කරන්නේ කුමක් මත දැයි දක්වන්න.

b. අනුක්‍රමික බදු යනු කුමක්දැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ආදායම් මාර්ගය බදුය. මෙරට තුළ බදු අයකරන ආයතන මොනවාදැයි දක්වන්න.

(iv) රාජ්‍ය වියදම් යන්න හඳුන්වා, එය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කර පැහැදිලි කරන්න.

(v) ජාත්‍යන්තරය විසින් සමරනු ලබන පාරිභෝගික දිනය සඳහන් කර, ප්‍රකාශිත පාරිභෝගික අයිතිවාසිකම් අටක් සඳහන් කරන්න.